**රත්තොට ප්‍රාදේශීය සභාව - 2020**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------------**

රත්තොට ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රත්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ණය හිමි කරන ලද ඇස්තමේන්තුගත අගය රු.1,700,000 ක ව්‍යාපෘති 03 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබියදී එම වටිනාකම 2017 හා 2019 වර්ෂ වලදී ණය හිමියන් යටතේ ගිණුම්ගතකර තිබුණු අතර ඊට අදාල ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ අවස්ථා 16 කදී ණය ගැතියන් යටතේ ගිණුම්ගත කරන ලද රු.1,487,335 ක් ඒ ඒ වර්ෂයන් හි අයකරගෙන තිබිය දී ණය ගැතියන් යටතේ තවදුරටත් ගිණුම්වල දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ඇ) | 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ ව්‍යාපෘති 17 කට අදාළ අතරුදවුම් මුදල් රු.551,179 ක් ණය හිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුවීම. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය ඉතිරි තොග වටිනාකම රු.292,681 ක් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කර්මාන්ත ණයහිමියන් රු.69,100 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.18,166,207 ක ගිණුම් විෂයයන් 4 කට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල ශේෂයන්ගේ එකතුව රු. 17,101,423 ක් වූයෙන් රු.1,629,878 ක වෙනසක් පැවතුණි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව. | ගිණුම් ශේෂ නිවැරදි කළයුතු වීම. |

**1.6.3 අවිනිශ්චිත ගිණුම**

1997 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.15,462 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය අදාල ගැලපීම් නොකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| වි ගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 17 ක එකතුව රු.34,494,921 ක ශේෂ තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලිපිගොනු, ලේඛන, උප ලේඛන හා සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | 2021 වර්ෂයේ ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුවීම. |

**1.7 අනුකූල නොවීම්**

නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 571(3) | රු.1,046,619 ක පොදු තැන්පතු 24ක් නිරවුල් කිරීමට කටයුතු නොකර 2016 වර්ෂයේ සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | පිළිගනිමි. | නීති, රීති, රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,952,145 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 12,240,547 ක් විය.

### 2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 17 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව වර්ෂයකට අධික කාලයක් හිඟහිටි දේපල 354 කට අදාල එකතුව රු.1,149,267 ක වරිපනම් බදු අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | කඩ කාමර 35 ක මාසික වාරික 10 කට වඩා හිඟ හිටි කඩ කාමර කුලී එකතුව රු.1,711,165 ක් සමලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2020 දෙසැම්බර් 16 දින සභාබල ප්‍රදේශය තුළ වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම් පිළිබඳව නියැදියක් ලෙස ව්‍යාපාර ආයතන 39 ක් සම්බන්ධව සිදුකළ ස්ථානීය පරීක්ෂාවට අනුව, ඉන් වෙළඳ ව්‍යාපාර 20ක් සඳහා වෙළඳ බලපත්‍ර ලබාදී නොතිබුණි. මේ හේතුවෙන් පරීක්ෂාවට භාජනය වූ එම ආයතන 20 න් පමණක් සභාවට රු.35,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | සභාවේ ජල යෝජනා ක්‍රම 14 ක් අතරින් ජල යෝජනා ක්‍රම 4 ක් 2014 සහ 2017 වර්ෂවල සිට අක්‍රීය තත්ත්වයේ පැවතිණි. 2020 නොවැම්බර් 18 වන දිනට අක්‍රීය ජල යෝජනා ක්‍රම වලින් රු.386,339 ක හිඟ ජල ගාස්තුවක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොවිඩ් 19 හේතුවෙන් අයකරගත නොහැකි බව | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1978 ඔක්තෝබර් 09 දින මැන සාදන ලද මුඩුක්කු සංහාර නිවාස යෝජනා ක්‍රමයට අදාළ පිඹුරෙහි සැලැස්මට අනුව මාතලේ රත්තොට ප්‍රධාන මාර්ගයේ සිට කුරුවාව ඔයට (දැලිවල ඔය) පිවිසෙන මාර්ගය අතරමැදින් වසා දමා එම පිඹුරේ අංක 37 නිවසට ඉදිරිපස , කුරුවාව ළමා උද්‍යානයට මායිම්ව පිහිටි එම ප්‍රවේශ මාර්ගය අවහිර කර හා ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් කොටසක පෞද්ගලික පාර්ශවයන් විසින් නිවසක් ඉදිකර තිබුණි. | අනවසර ඉදිකිරීම සඳහා නීත්‍යානුකූල කරගන්නා ලෙස අදාළ පාර්ශව වෙත දැනුවත් කර ඇති බව | නීතිමය ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඊ නැණසල වැඩසටහන යටතේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයෙන් පරිගණක හා උපාංග ලබාගෙන පිහිටුවා තිබුණු පරිගණක පුහුණු මධ්‍යස්ථානය 2019 වර්ෂයේ සිට වසා දමා තිබුණි. මේ හේතුවෙන් සහනදායී මුදලකට පරිගණක පුහුණු පාඨමාලාවක් හැදෑරීම සඳහා ග්‍රාමීය දරුවන්ට තිබුණු අවස්ථාව අහිමි වී තිබුණු අතර මෙම පරිගණක සහ උපාංගවල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ද දක්වා නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව | පාඨමාලාව ආරම්භ කර පවත්වා ගත යුතු වීම. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හුණුගල්වත්ත දේවාලය අසළ ප්‍රජාශාලා ගොඩනැගිල්ලේ වහලය ඉදිකිරීමේ කර්මාන්තයේ ගෙවීම් බිල්පතෙහි වැඩ විෂයය අංක 03 හා 05 අනුව වහලයට මිලි මීටර 62×62×6 ප්‍රමාණයේ යකඩ පර්ලින් යොදා ඇති බවට කාර්මික නිලධාරි නිර්දේශ කර යකඩ පර්ලින් මීටර 220 ක් සහිත වහලය සඳහා රු.600,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද භෞතික පරීක්ෂාවේ දී වහල සඳහා මි.මී.50×50 × 5 ප්‍රමාණයේ යකඩ පර්ලින් යොදා ඇති බව නිරීක්ෂණය වූයෙන් ඒ සඳහා රු. 75,284 ක් වැඩිපුර ගෙවා තිබුණි. එසේම ඇස්තමේන්තු ප්‍රමිතියට යකඩ පර්ලින් නොයෙදීම හේතුවෙන් වහලයේ ශක්තිමත් භාවය පිළිබඳ ගැටළුවක් ඇතිවිය හැකි බව ද නිරීක්ෂණය විය. | වැඩිපුර ගෙවීම් ගණනය කර අදාළ කොන්ත්‍රාත්කාර සමිතියෙන් අයකර ගන්නා බව. | පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වීම. |